**රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 01/2014**

මගේ අංකය:PSC/APP/03/62/2012

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

අංක:177

නාවල පාර,නාරාහේන්පිට.

2014 ජනවාරි මස 31 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**<u>කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම</u>**

රාජ්‍ය සේවයේ තනතුරකට/සේවයකට පත් කරනු ලබන යම් නිලධාරියකු පත්වීම් දින සිට වසර 03ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු අතර ඔහු/ඇය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හෝ බඳවා ගැනීම් පටිපාටිවල සඳහන් ඊළඟ ඉහළ පන්තියට/ශ්‍රේණියට උසස්වීම් ලැබුවහොත් එම උසස් කිරීම ක්‍රියාත්මක වන දින සිට වසර 03 ක් ඇතුළත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

02. එසේවුවද, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත පරිදි නොපැවැත්වීම නිසා ඇතිවන පරිපාලනමය ගැටලු සම්බන්ධයෙන් පහත සඳහන් සහනය ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

"නියමිත පරිදි විභාග නොපැවැත්වීම මත කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්පූර්ණ කිරීමට නොහැකිවූ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට හානි නොවන පරිදි ස්වකීය පත්වීම්/උසස්වීම් දිනයේ සිට පවත්වනු ලබන අනුගාමී විභාග (4) හතරක් මඟින් පළමු/දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමට නිලධාරියෙකුට පුළුවන."

03. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හෝ බඳවා ගැනීම් පටිපාටිවල සඳහන් කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධයෙන් වන සහන ඉල්ලීම් සඳහා වන නිර්දේශ 02/2011(I) ආකෘති පත්‍රයට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී.එම්.එල්.සී. සේනාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.